000007

IHRA

UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2015/2016

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2018 ජුනි/ ජූලි)**

# BLE 206 - ශ්‍රී ලංකාවේ ශ්‍රම භාවිතයේ ඓතිහාසික පැතිමාන

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(2) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(3) කාලය පැය තුනයි (03).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. ශ්‍රී ලංකාවේ මුල් කාලීන ජනාවාස බිහිවීම, සංවර්ධනය වීම සහ නිරිත දිගට සංක්‍රමණය වීම කෙරෙහි බලපෑ හේතු සාධක පැහැදිලි කරන්න.

(ලකුණු 20)

02. සමාජයීය ශ්‍රම විභජනය යනු කුමක්දැයි පැහැදිලි කර රජරට සමාජ සැකැස්ම තේරුම් ගැනීම සඳහා එම සංකල්පය යොදා ගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 20)

03. විවාහය සහ ඥාතීත්වය යන සංකල්ප පැහැදිලි කර සමාජ ව්‍යුහ තේරුම් ගැනීම කෙරෙහි මෙම සංකල්ප ඉවහල් වන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

04. ආගමක් බිහිවීම කෙරෙහි බලපෑම් කරනු ලබන සාධක සාකච්ඡා කර වර්තමාන සමාජය තුළ ආගමෙහි කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 20)

05. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයෙහි හඳුන්වාදෙන ලද විවිධ ප්‍රතිසංස්කරණ, පසු කාලීනව දේශපාලන ක්ෂේත්‍රය කෙරෙහි කරන ලද බලපෑම් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

06. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය, ලාංකික අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි ඇති කරන ලද බලපෑම් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

07. වතු වැවිලි ආර්ථිකය හඳුන්වාදීම මඟින් ලාංකීය දේශපාලනයට සහ ආර්ථිකයට කරන ලද බලපෑම පැහැදිලි කරන්න.

(ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා හතරක් (4) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ස්ත්‍රී පුරුෂ සමාජභාවය
ii. සංස්කෘතික විසරණය
iii. සමාජ සමූහ
iv. තත්වය හා කාර්යභාරය
v. රාජකාරි ක්‍රමය

(ලකුණු 20)

************************